# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/22 - 2018 මැයි මස 02 වැනි බදාදා - 2018.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර-පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගිරාකඩුව පොම්පාගාරය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටස් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1365

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 631 ගිරාකඩුව ග්‍රාම නිලධාරී වසමේ ගිරාකඩුව ගමේ පිහිටි (ඉඩමේ නම නොදනී) ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 14.1ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස් තුන :

01. කැබලි අංක 01 - ප්‍රමාණය : පර්චස් 13ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස, ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය සහ අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 03 ; |
| *දකුණට* | : | ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය හා අශෝකා විජේසිංහ මහත්මිය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා අශෝකා විජේසිංහ මහත්මිය හිකිකම් කියන ඉඩම. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 01. ඒ. එම්. අබේරත්න මයා,
30/12A, ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

02. ඒ. එම්. අනෝමා කුමාරිහාමි මිය,
30/1A, ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

03. රංජිත් බණ්ඩාර මහතා,
30/2B, ගිරාකඩුව,
ජම්බුගහපිටිය

හා තවත් අය

02. කැබලි අංක 02 - ප්‍රමාණය : පර්චස් 0.8ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 සහ අශෝකා විජේසිංහ මිය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 සහ ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය ; |
| *දකුණට* | : | ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය සහ නිදහස් ආදර්ශ විදුහල හරහා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *බටහිරට* | : | නිදහස් ආදර්ශ විදුහල හරහා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය හා අශෝකා විජේසිංහ මිය හිමිකම් කියන ඉඩම |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. අශෝකා විජේසිංහ මිය,
අංක 40/1,
බිනර ඔටෝ සර්විස්,
පලුගස්දමන,
පොළොන්නරුව.

03. කැබලි අංක 03 - ප්‍රමාණය : පර්චස් 0.3ක් පමණ

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 සහ ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය ; |
| *දකුණට* | : | ගිරාකඩුව කෘෂිකර්ම මාර්ගය සහ අත්කර ගැනීම යෝජිත කැබලි අංක 01 ; |
| *බටහිරට* | : | අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01 සහ මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 01. ඒ. එම්. අබේරත්න මහතා,
30/12A, ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

02. ඒ. එම්. අනෝමා කුමාරිහාමි මිය,
30/1A, ගිරාකඩුව,
ජම්බුගහපිටිය.

03. රංජිත් බණ්ඩාර මහතා,
30/2B, ගිරාකඩුව,
ජම්බුගහපිටිය

හා තවත් අය.

05 -472

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ අස්ගිරිය බූස්ටර් පොම්පාගාරය හා නල මාර්ගය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/3/1/1372

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරළේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 235 අස්ගිරිය ග්‍රාම නිලධාරී වසමේ අස්ගිරිය ගමේ පිහිටි අබේසේකරලාගේ වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 24.5ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් තුන.

01. කැබලි අංක : 01 - ප්‍රමාණය : පර්චස් 14ක් පමණ.

*උතුරට* : රෝහිණී පුෂ්පකාන්ති පෙරේරා ජයවීර මහත්මිය හා තවත් අය හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : කේ. එන්. පෙරේරා මහත්මිය හා තවත් අය හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

02. කැබලි අංක : 02 - ප්‍රමාණය : පර්චස් 2ක් පමණ.

*උතුරට* : කේ. එන්. පෙරේරා මහත්මිය හා තවත් අය හිමිකම් කියන ඉඩම ;
*නැගෙනහිරට* : ශ්‍රී ධම්මසිද්ධි මාවත ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*බටහිරට* : අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 01.

03. කැබලි අංක : 03 - ප්‍රමාණය : පර්චස් 8.5ක් පමණ.

*උතුරට* : අත්කර ගැනීමට යෝජිත කැබලි 01 ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : පෞද්ගලික කොන්ක්‍රීට් පාර ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්* : 01. ගරුතර විහාරාධිපති ස්වාමින් වහන්ස,
ශ්‍රී විජයසුන්දරාරාමය,
අස්ගිරිය,
මහනුවර

02. මහා භාරකරු,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

05 -473

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක : 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ජා-ඇල හා ඒකල මලනල පද්ධතිය දිර්ඝ කිරිමේ ව්‍යාපෘතිය යටතේ අංක 10 පොම්පාගාර ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1359

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 190A වැලිගම්පිටිය - උතුර ග්‍රාම නිලධාරී වසමේ, ජා-ඇල ගමේ පිහිටි අංක 9/89 නිවාස ඉඩමේ බටහිර දිසාවට මායිම් වූ ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | අංක 9/89 දරන නිවාස ඉඩම ; |
| *දකුණට* | : | හිමිකරුවකු නොදන්නා හිස් ඉඩම ; |
| *බටහිරට* | : | අඩි 6ක් පළළ ඇල මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* සොයාගත නොහැක.

05-474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.